# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/83 - 2018 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

බලය පැවරීමේ නියෝගය

උතුරු මැද පළාත් සභාවේ 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ආණ්ඩුකාර මාරප්පුල්ලිගේ ජයසිංහ වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ බලතලවලින් උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහය වීමට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) තනතුරේ රාජකාරි සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් අය වෙත එම උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලු බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

මාරප්පුල්ලිගේ ජයසිංහ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

ආණ්ඩුකාරවර කාර්යාලය,
උතුරු මැද පළාත.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| තිළිණි අයෝමි පතිරගේ | 2018 ජූනි | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58, (58(3) 58(4) හා 58 (5)හැර), 59, වගන්තියේ (1) ආ හැර යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16 (II), 19, 33, 35, 37, 39, 40, 41(41(1)අ හැර), 42, 49, (49 (xii) හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

09 - 583

1A - PG 4206 — 37 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*